මාගේ අකංය:T.06/514CSRP/RT &SR
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්මේන්තුව
දුම්රිය මූලස්ථානය
කොළඹ 10
2026.06.09

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**රජයේ නිලධාරීන්ට ලබා දෙන අනුග්‍රහ දුම්රිය වාරප්‍රවේශපත්‍ර නිකුත්කිරීම 'ප්‍රවේශ' මාර්ගගත පද්ධතිය ඔස්සේ සිදු කිරීම**

ආයතන සංග්‍රහයේ XVII පරිච්ඡේදය අනුව, රජයේ නිලධාරීන්ට අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම 2026.06.09 දින සිට මාර්ගගත ක්‍රමය ඔස්සේ ක්‍රියාත්මක කිරීමට නියමිතය. ඒ සඳහා මෙම උපදෙස් නිකුත් කරනු ලැබේ.

01. රජයේ ආයතන ලියාපදිංචි කිරීම

1.1 තම ආයතනයේ රජයේ නිලධාරීන් තහවුරු කිරීම, ඔවුන්ගේ අනුග්‍රහ වාරප්‍රවේශ පත්‍ර ඉල්ලීම් අනුමත කිරීම සහ දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවීමට ඇති මුදල් ගෙවීම තහවුරු කිරීම සඳහා සෑම රජයේ ආයතනයකටම දුම්රිය දෙපාර්තමේන්තුවේ 'ප්‍රවේශ' මාර්ගගත පද්ධතියට පිවිසීම සඳහා පරිශීලක ගිණුම් (User Accounts) සකස් කරනු ලැබේ.

1.2 ප්‍රථම වටයේදී සියලුම අමාත්‍යාංශ සහ පළාත් සභා සඳහා 'ප්‍රවේශ' පද්ධතියට මාර්ගගත පිවිසුම් දුම්රිය දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලැබේ.

1.3 අමාත්‍යාංශ සහ පළාත් සභා යටතේ පවතින ආයතන (පළාත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, ව්‍යවස්ථාපිත ආයතන) සඳහා මාර්ගගත පිවිසුම් සකස් කිරීමට පහසුකම් පද්ධතිය හරහා අදාළ අමාත්‍යාංශ සහ පළාත් සභා වෙත ලබා දෙනු ලැබේ.

1.4 අමාත්‍යාංශ සහ පළාත් සභා යටතේ පවතින ආයතනයක් යටතේ ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක වන ආයතන (දිස්ත්‍රික් ලේකම් කාර්යාල, පළාත් අධ්‍යාපන / සෞඛ්‍ය කාර්යාල) සඳහා මාර්ගගත පිවිසුම් සකස් කිරීමේ පහසුකම් එම ආයතන අධීක්ෂණය කරන ආයතන වෙත හැකියාව ඇත.

1.5 මේ ආකාරයට සියලුම රජයේ ආයතන ලියාපදිංචිය සහ මාර්ගගත ප්‍රවේශ සකස් කිරීම අමාත්‍යාංශ / පළාත් සභා මට්ටමේ සිට පහළට අධීක්ෂණ මට්ටම් අනුව ක්‍රියාත්මක කළ යුතුය.

1.6 රජයේ ආයතන ලියාපදිංචි කිරීමේදී එම ආයතනය පළාත් සභා ආයතනයක්ද, ව්‍යවස්ථාපිත ආයතනයක්ද ලෙස නිවැරදිව ලියාපදිංචි කිරීමේ වගකීම එය සිදු කරන ආයතනය සතු වේ.

1.7 යම් ආකාරයකින් අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ බලය හිමි ආයතනයක් බවට තහවුරු කිරීමට නොහැකි ආයතනයක් සම්බන්ධයෙන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් උපදෙස් දුම්රිය දෙපාර්තමේන්තුවෙන් ලබා ගත යුතුය.

02. අනුග්‍රහ වාර ප්‍රවේශ ඉල්ලා සිටින දුම්රිය මගීන් ලියාපදිංචිය (Passenger Profile Creation)

2.1 අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍ර ලබා ගැනීම සඳහා සියලුම මගීන් මාර්ගගත පද්ධතියේ ලියාපදිංචි විය යුතුය. ඒ සඳහා ක්‍රමවේද 04ක් හඳුන්වා දී ඇත.

I. 'ප්‍රවේශ' ජංගම දුරකථන පිවිසුම හරහා ලියාපදිංචි වීම
II. 'ප්‍රවේශ' වෙබ් පිවිසුම ඔස්සේ ලියාපදිංචි වීම
III. ඩිජිටල් දුම්රිය ප්‍රවේශපත්‍ර නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දුම්රිය ස්ථානයකට ගොස් ලියාපදිංචි වීම
IV. තමන් රාජකාරි කරන ආයතනයේ 'ප්‍රවේශ' පද්ධතිය ඔස්සේ ලියාපදිංචි වීම

2.2 ලියාපදිංචි වූ රජයේ නිලධාරියෙකු අනුග්‍රහක වාර ප්‍රවේශපත්‍ර ලබා ගැනීමටනම් එම නිලධාරියා සේවය කරන රජයේ ආයතනය විසින් එම ලියාපදිංචි වූ මගී පරිශීලක ගිණුම සහතික කළ යුතුය.

03. <u>වාර ප්‍රවේශපත්‍ර අයදුම් කිරීම</u>

3.1 රජයේ ආයතනයක් යටතේ සහතික කරන ලද මගී පරිශීලක ගිණුමකින්(Passenger Profile) රජයේ අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍රයක් අයදුම් කිරීමට හැකියාව ඇත.
3.2 ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව ඉල්ලා සිටින අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍රයේ වලංගු කාලය මාස 01 සිට මාස 03 දක්වා වන පරිදි අයදුම් කළ හැක.
3.3 වලංගු වාර ප්‍රවේශපත්‍රයක් මිලදී ගැනීම සඳහා රජයේ නිලධාරියෙකුගේ අනුග්‍රහක වාරප්‍රවේශ පත්‍ර ඉල්ලීම අදාළ රජයේ ආයතනය විසින් අනුමත කළ යුතුය.

04. <u>වාර ප්‍රවේශපත්‍ර සඳහා ගෙවීම් කිරීම</u>

4.1 ආයතනය විසින් අනුමත කරන ලද අනුග්‍රහ වාර ප්‍රවේශ පත්‍රයකට ගෙවීම් කිරීම ක්‍රම තුනක් ඔස්සේ සිදු කළ හැක.
I. ඉල්ලුම් කළ නිලධාරියාගේ ජංගම දුරකථන යෙදවුම මගින් මාර්ගගත ක්‍රමයට
II. ප්‍රවේශ වෙබ් අඩවිය ඔස්සේ මගී පරිශීලක ගිණුමකින් මාර්ගගත ක්‍රමයට
III. ඩිජිටල් දුම්රිය ප්‍රවේශපත්‍ර නියමු ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන දුම්රිය ස්ථානයක් මගින් (කොළඹ සහ මරදාන දුම්රිය ස්ථාන ද ඇතුලුව)

05. <u>වලංගු වාර ප්‍රවේශපත්‍රයක් භාවිතා කරමින් දුම්රිය සේවය භාවිතා කිරීම</u>

5.1 දුම්රිය මගින් ගමන් කිරීමේ දී සෑම විටම වලංගු අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍රය තමා සන්තකයේ තබා ගත යුතු අතර දුම්රිය සේවය භාවිතා කිරීමේදී දුම්රිය නිලධාරියෙකු ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
5.2 වලංගු වාර ප්‍රවේශපත්‍රය තමාගේ ජංගම දුරකථනයේ ජංගම දුරකථන යෙදවුම මගින් ඉදිරිපත් කිරීමට හැකියාව ඇත.
5.3 ජංගම දුරකථන යෙදවුම නොමැති නිලධාරීන් මුදල් ගෙවා ලබා ගන්නා ලද වලංගු වාරප්‍රවේශපත්‍රයේ මුද්‍රිත පිටපතක් ඉදිරිපත් කළ යුතුය.
5.4 වලංගු අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍රයක් ඉදිරිපත් කිරීමට නොහැකි වන විට ඒ පිළිබඳව දුම්රිය ආඥා පනතේ විධිවිධානවලට අනුකූලව නීති මගින් කටයුතු කරනු ලැබේ.

06. රජයේ ආයතන මගින් දරණ අනුග්‍රහ මුදල දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කිරීම

6.1 අනුග්‍රහ දුම්රිය වාර ප්‍රවේශපත්‍ර නිකුත් කිරීම වෙනුවෙන් පළාත් සභා ආයතන, ස්වාධීන කොමිෂන් සභා සහ ව්‍යවස්ථාපිත ආයතන විසින් දරණ අනුග්‍රහක මුදල (25%) චෙක්පත් මගින් දුම්රිය දෙපාර්තමේන්තුවට යොමු කර ඒ බව පද්ධතියේ තහවුරු කළ යුතුය.

6.2 එම සියලු මුදල් ඊලග මාසයේ 15 දිනට පෙර අදාළ ආයතන විසින් දුම්රිය දෙපාර්තමේන්තුවට ගෙවා අවසන් කළ යුතුය.

6.3 රජයේ අනුග්‍රහ මුදල දුම්රිය දෙපාර්තමේන්තුවට බැර කිරීමට අපොහොසත් වන ආයතනයක නිලධාරීන් වෙනුවෙන් වාරප්‍රවේශපත්‍ර නිකුත් කිරීමේ පහසුකම නතර කිරීමට දුම්රිය දෙපාර්තමේන්තුවට හැකියාව ඇත.

07. මාර්ගගත පද්ධතිය භාවිතා කිරීමට උපදෙස්, මෙහෙයුම් සහ තාක්ෂණික සහය

7.1 රාජ්‍ය ආයතනවලට සහ රජයේ නිලධාරීන්ට 'ප්‍රවේශ' මාර්ගගත පද්ධතියට පිවිසීම සම්බන්ධ උපදෙස් ඇමුණුම යටතේ දක්වා ඇත. www.railway.gov.lk යන විද්‍යුත් ප්‍රවේශය ඔස්සේ ද එම උපදෙස් වෙත පිවිසීමට හැකියාව ඇත. මීට අමතරව පද්ධතිය භාවිතා කරන ආකාරය සම්බන්ධ වීඩියෝ මාර්ගෝපදේශයට ද ඒ ඔස්සේ පිවිසීමට හැකියාව ඇත.

7.2 පද්ධතිය භාවිතා කිරීමට අවශ්‍ය තාක්ෂණික උපදෙස් පහත දුරකථන අංක ඔස්සේ දුම්රිය දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ අංශය සම්බන්ධ කර ගැනීමට ද හැකියාව ඇත.

011 2302719

1971

ඇමුණුම්:

1. රජයේ ආයතන 'ප්‍රවේශ' පද්ධතියේ ලියාපදිංචි වීමට සහ අනුග්‍රහ වාරප්‍රවේශපත්‍ර කළමනාකරණය කිරීමට අවශ්‍ය උපදෙස්
2. රජයේ නිලධාරියෙකුට අනුග්‍රහ වාර ප්‍රවේශපත්‍රයක් ලබා ගැනීමට අවශ්‍ය උපදෙස්

රවීන්ද්‍ර පත්මප්‍රිය
දුම්රිය සාමාන්‍යාධිකාරී

පිටපත:

1. විගණකාධිපති